විදු ලොව

ඇඟ ඇට කඩන උණ ලෙසට ගැමි වහරේ සරලව දැක්වෙන ඩෙංගු සහ විකන්ගුන්යා රෝගවල ප්‍රධානම රෝග ලක්ෂණය ව්‍යාප සන්ධි ප්‍රදාහයයි. එයිනුත් ඩෙංගු වලට වඩා වැඩි කාලයක් එම රෝග ලක්ෂණ රඳවාගන්නේ විකන්ගුන්යා රෝගයයි. ටැන්සානියාවේ වසන මැකොන්ඩේ ජාතිකයන්ගේ බසින් බිඳී ආ විකන්ගුන්යා යන නමෙහි තේරුම ලෙසට දැක්වෙන්නේද ''වකය ඇති කරන'' යන්නයි. විකන්ගුන්යා මුලින්ම හඳුනා ගැනෙන්නේ 1953 ටැන්සානියාවෙන් වන අතර, 1950ස් ගණන් වල පිලිපීනයේ සහ තායිලන්තයේ ඇතිවුන වසංගත උණක් ලෙසට ඩෙංගු මුලින්ම හඳුනාගැනේ. මෙම රෝග දෙකම එකිනෙකට වෙනස්වූ වෛරස් දෙකක් නිසා ඇතිවූවද, ඒගූ හෝ සෙම්ප්‍රතිශ්‍යාව වැනි වෙන තවත් වෛරස් රෝග මෙන් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට බෝනොවී, රෝග පැතිරීයාම මදුරුවෙක් නිසා සිදුවීම මෙහි ඇති විශේෂත්වයයි.

මේ රෝග පතුරුවන මදුරු විශේෂය හඳුන්වන්නේ '*Aedes aegypti*'යන නමිනි. ඩෙංගු සහ විකන්ගුන්යා පමණක් නොව කහ උණ (සෙංගමාලය නොවේ) වැනි තවත් වෛරස් රෝග පැතිරවීම සඳහා වගකිවයුතු වන්නේද මෙම '*Aedes aegypti*' මදුරුවායි. සාපේක්ෂව ශරීර ප්‍රමානය කුඩා වීමත්, තද කලු පැහැති ශරීරයේ සුදුපාට තිත් ඇඟේත්, කකුල් මත සුදුපාට වලලුත් තිබීම මේ මදුරුවා හඳුනාගත හැකි පහසුම ආකාරයයි.

මිනිස් ඇසුරෙහි ජීවත්වීම සඳහා බොහෝ දුරට අනුවර්තනය වූ මදුරුවෙක් ලෙසට මෙම මදුරු විශේෂය පිළිබඳව සඳහන් කරයි. නිවාස ඇතුලතම ජීවත්වෙමින්, ලී බඩු යට, ඇඳුම් රාක්ක, කිලිටි රෙදි ගොඩවල්, ඇරී ඇති පෙට්ටි, ඇඳුරු කාමර වැනි අඳුර සහිත ස්ථාන වල දවල් කාලයේ වෙසෙමින්, මිනිසුන්ගේ අතට ලෙහෙසියෙන් හසුවී පොඩිවීයාහැකි වන පරිදි ලේ උරාබීම සඳහා මුහුණට කෙලින්ම නොවසන මෙම මදුරුවා, බොහෝ විට දිවා කාලය තුලදීම කකුලේ වළලුකර සහ බෙල්ලේ පිටුපස වැනි තැන් වලට පමණක් විදැ ලේ උරාබීම සිදුකරයි. මිනිසුන් වෙතින් පැන යාමේදී අල්ලාගැනීමට අපහසුවන පරිදි සැණින් ඉදිරියටත් පසුපසටත් වේගයෙන් පියඹායාම මොවුන්ගේ සුපුරුදු ගතියයි. එපමණක්ද නොවේ, ඔවුන් මිනිස් කණට ඉතා හිරිහැරයක් වන රෑං-රෑං ශබ්දය නගන්නේද ඉතා අඩුවෙන් යැයිද පැවසේ. තම වර්ග බොහොමයක් කැලයෙහි වල් සතුන් සමඟ ජීවත් වෙත්දී, මිනිස් ඇසුරෙහිම වෙසෙමින්, රෝග බෝ කරමින්, මිනිසාට කරදර ඇති කරන මෙම ගතිලක්ෂණ නිසාම මෙම මදුරුවා 'මදුරු කැරපොත්තෙකු' ලෙසටද හඳුන්වයි.

සෑම මදුරු විශේෂයකම ලේ උරා බීම සිදුකරන්නේ ගැහැනු මදුරුවන් පමණකි. ඒ උන්ගේ ප්‍රජනන කාලයේදී මදුරු බිත්තර ලේවම සඳහා මිනිස් හෝ සත්ව ලේ අවශ්‍යවන බැවිනි. පිරිමි මදුරුවා ශාක හෝ පලතුරු වල යුෂ උරාබොයි. පරිසර තත්ව යටගෙදී වෙනස්වීය හැකි වුවද සාමාන්‍යයෙන් දින 15-65 දක්වා දිගු ආයුකාලයක් මේ මදුරුවා සතුය. එයිනුත් ඉතාම කෙටි ආයුකාලයක් සතුවන්නේ පිරිමි මදුරුවාටයි.

රෝගී තැනැත්තෙකුගෙන් රුධිරය උරාබීම නිසා ගැහැනු මදුරුවා තුලට ඇතුළුවන රෝග කාරක වෛරස මදුරුවාගේ බේට ග්‍රන්ථ තුල උගේ ජීවිත කාලය පුරාම රැඳී සිටියි. මෙසේ මදුරුවෙක් තුලට රෝගියෙකුගෙන් වෛරස ඇතුළුවීම එම රෝගියාට වෛරස් ආසාදනය සිදුවී දින 2-12 දක්වා කාලයක් තුල, එනම් වෛරස රෝගියාගේ රුධිර පද්ධතිය තුල සංසරන වෙමින් පවතින කාලය තුල පමණක් සිදුවේ. මදුරුවා තුලට ඇතුළුවන වෛරස දින 8-11 දක්වා බිජෝෂණ කාලයක් ගත කරයි. ඉන්පසුව එම මදුරුවා නැවත ලේ උරා බොන අවස්ථාවකදී එම තැනැත්තාගේ ශරීරයට මදුරුවා විසින් වෛරස ඇතුළු කරයි. සිය තුඩින් විදැ ලේ උරාබීමට පෙර මදුරුවන් මුලින්ම කරන්නේ මිනිස් රුධිරය කැවී ගැසීම වැලැක්වීම සඳහා හේතුවන ප්‍රෝටීන තම කෙල සමඟ තුවාල කල ස්ථානයට ඇතුළු කිරීමයි. එසේ නොවේ නම් සම විවරවූ තැන ඉක්මනින්ම කැවී ගැසෙන රුධිරය උරාබීමට මදුරුවන්ට අවස්ථාව නොලැබේ. මදුරුවා ඉවත්ව ගිය පසු තුවාලය අවට ඇතිවන ඉදිමුම සහ කැසීමට හේතුවද එම මදුරු ප්‍රෝටීනයි. එම මදුරු ප්‍රෝටීන ශරීරයේ වසා පද්ධතිය මගින් බිඳ දමන තුරුම තුවාලය අවට කැසීම නොනවතින අතර ශරීරයට ඇතුළුවූ වෛරස සඳහා ප්‍රතිශක්තියක් වසා පද්ධතිය තුල නොමැති බැවින් එම තැනැත්තා රෝගයට ගොදුරුවේ. අනෙක් වදදගත් කරුණ නම් මෙම මදුරු මව හරහා අයගේ බිත්තර තුලටද එම වෛරස ඇතුළු වීම නිසා ඉදිබේම ඇගේ ඊළඟ පරම්පරාවෙන් හරි අඩක්ම රෝග වාහකයන් වීමයි. සාමාන්‍යයෙන් ගැහැනු මදුරුවා සම-ප්‍රමානයක් ගැහැනු සහ පිරිමි බිත්තර දමයි.

ඩෙංගු හෝ විකන්ගුන්යා රෝග කාරක වෛරස මිනිසා-මදුරුවා-මිනිසා හරහා පමණක් හුවමාරුවේ. මේ රෝග සඳහා එන්නත් හෝ විශේෂ ප්‍රතිකාර නොමැති අතර රෝග වෛරසයේ හඳුනාගත් මුල් දිනවල හැකිතාක් දුරට මදුරුවන්ට ලේ උරාබීමට ඇති ඉඩකඩ අතුරාගැනීම රෝග පැතිරයාම වැලැක්වීම සඳහා ඇති හොඳම උපක්‍රමයයි. විකන්ගුන්යා වරක් සෑදීම ජීවිත කාලය පුරාම ප්‍රතිශක්තිය ලැබීමට හේතුවුවද, ඩෙංගු පතුරුවන වෛරස් වර්ග 4ක්ම ඇති බැවින් ප්‍රතිශක්තිය හිමිවන්නේ රෝගය වරක් සඳපුනු වෛරස් කාණ්ඩය සඳහා පමණකි.

මේ කැරපොතු මදුරුවාගේ අනිත් විශේෂම ගති ලක්ෂණය නම් නිවෙස් තුල හෝ ඒ අවට නිර්මානය වී ඇති ගලානොයන පිරිසිදු ජලයේ (වෙනත් ක්ෂුද්‍රජීවීන් ජීවත් නොවන) මොවුන් බිත්තර දැමීමයි. ඉවත දමන කෑන්, පරණ බාල්දි, පොග්ගු, මල් බඳුන්, මල් පෝච්චි යට තබන වතුර රඳන තැට්ටල, කුරුල්ලන් සඳහා ගෙවත්තේ තබා ඇති ජලරඳන, ඉවත දැමූ ටයර්, පරිහරණය සඳහා නිවෙස්වල තනා ඇති කුඩා වතුර ටැංකි, නිවෙස අවට වැහිවතුර එකතුවී ඇති තල් පොල් වැනි ශාක අතුමත, ගස් බෙන හෝ පඳුරුගොබ මැද වැනි වැසිවතුර ස්වභාවිකව රඳන තැන් මෙම මදුරුවන් බිත්තර දැමීමට තෝරාගන්නා ස්ථානයි. එයින් ජලය රැඳී තිබියදුකු ස්ථාන වල ඇති ජලය සතියකට වරක් ඇලුත් කිරීමෙන් සහ නිවෙස් අවට පරිසරය පිරිසිදුව තබාගැනීමෙන් මදුරුවන් බෝවීම වලක්වාගත හැක. කැරපොත්තන් සඳහා භාවිතා කරන කෘමිනාශක වැඩුනු මදුරුවන් රඳන ස්ථානවලින් ඔවුන් පලවා හැරීමටත් මර්ධනය කිරීමටත් යොදා ගත හැක. මෙම මදුරු විශේෂයට වැඩිදුරක් පියැඹීමේ හැකියාව නොමැති නිසා (අඩි 100 සිට යාර 100 අතර දුරක් සාමාන්‍ය පියාඹා සීමාව ලෙසට වාර්තා වේ) තම නිවෙස් තුල සහ ඒ අවට ගැන විශේෂ අවධානයක් යොමුකරමින් මදුරුවා මර්ධනය කිරීමට උත්සාහ ගැනීම මෙම වේදනාකාරී රෝග වලකා ගැනීම සඳහා බොහෝ දුරට ඉවහල්වනවා මෙන්ම එය ප්‍රජා සෞඛ්‍ය වෙනුවෙන් කරනු ලබන මෙහෙයක්ද වනු ඇත.

ආචාර්ය
විද්‍යානි මනතුංග

මුහුණට
කෙලින්ම නොවසන
මෙම මදුරුවා,
බොහෝ විට දිවා
කාලය තුලදීම
කකුලේ වළලුකර සහ
බෙල්ලේ පිටුපස වැනි තැන් වලට පමණක්
විදැ ලේ උරාබීම සිදුකරයි. මිනිසුන් වෙතින්
පැන යාමේදී අල්ලාගැනීමට අපහසුවන පරිදි
සැණින් ඉදිරියටත් පසුපසටත් වේගයෙන්
පියඹායාම මොවුන්ගේ සුපුරුදු ගතියයි.

සෙනෙහස වෙනුවෙන් මියෙනතුරා....

අද ඉමු. - කොහේද?
කොහේ හරි. - පිස්සුද?
ඔව්.
තේරුම් ගන්න
අවුරුදු දහයක්ම උත්සහ කළා.
එහෙම කලේ මම. - නෑ මම.
ඉස්සර වගේමයි එකට එක.

නිර්මලි
ඇයි?
ඔයා හෙට එනවද?
හරියටම කියන්න බෑ.
ඇයි?
එයා සැක හිතයි.
ප්‍රශ්නයක්ද?
ඉකි බිඳුමක්..
හිරිහැරයක්ද?
නෑ.
එහෙනම්?
හිඟඩය.
එහෙනම් මම කියන්නම්.
එපා.
වැරැද්ද මගේ. මට ඔයාව බැඳගන්න උවමනා
තිබිබේ නෑ.
දැන් ඒවායින් වැඩක් නෑ.
හිශ්ශබ්දතාවයක්.
හෙට මම එනවා.
ස්ථිරතාවයක්.

චතුර?
ඇයි?
මොනවද කල්පනා කරන්නේ?
ආදරේ ගැන.
කාගෙද?
අපේ.
පිස්සු
ආදරේ පිස්සුවක්ද?
ඔව්. ඒත් ඒ හුඟක් ඉස්සර.
දැන්?
ආදරේ අපිව පහුකරන් ගිහින් චතුර.
අපිට ඉස්සර වගේ ආදරෙන් ඉන්න බැරිද?
පුලුවන්. ඒත් ඉස්සර වගේම බැරිවෙයි.
සීමාසහිත ආදරයක්.
ආදරයට සීමා වැටපවුරු නෑ චතුර.
එහෙනම්?
අපි දැන් දකින්න පුළුවන් ආදරේ ගැඹුර විතරයි.
ඔයා වයසට ගිහිල්ලා.
එතකොට ඔයා?
මම මැරිලා. ආදරේ නැතිව මට ජීවත් වෙන්න බෑ.
පිස්සු ඔයාගේ ඇස් තාමත් ආදරෙන් දිලිසෙනවා.
සීතාවැලක්.
අර හිනාව එහෙමයි. ඔයානම් නිර්මලීමයි.

ඇයි අපි මුණගැහුනේ?
නිකං
අපි බැඳලා
යසෂ්‍යයක්?
ඒ දැන්.
එතකොට ඔයා?
මම කෙල්ලෙක්. මටත් විකල්පයක් ඕන වුනා.
විකල්පද? හිරගෙවල්ද?
ලැබීම
බම්බුව
වෙලා ගිහිල්ලා
අද ඉමු.
කොහේද?
කොහේ හරි.
පිස්සුද?
ඔව්.
තේරුම් ගන්න
අවුරුදු දහයක්ම උත්සහ කළා.
එහෙම කලේ මම.
නෑ මම.
ඉස්සර වගේමයි එකට එක.
නිර්මලි
ඇයි?
උන් දෙන්නට බම්බු ගහන්න කියලා අපි එකතු වෙමු?
පුලුවන් වැඩක්ද?

ඇයි බැරි?
ඔයාට එදත් ඕක කරගන්න බැරි වුනා.
ඉතිං?
අපේ ළමයි?
හිඟඩතාවයක්..

චතුර මොනවද කල්පනා කරන්නේ?
බැරෑරුම් ප්‍රශ්නයක් ගැන.
මොකක්ද?
මේ වැවේ වතුර බාල්දි කීයක් විතර ඇතිද කියලා?
සීතා වැලක්.
ඔයා ඉස්සර වගේම කෝලං කරනවා.
ඉස්සර වගේම මට ආදරේද?
ඒක කියන්න බෑ.
මගේ හිතට ලොකු දුකක් දැනෙනවා නිර්මලි.
මටත් දැනෙනවා චතුර.
මම කැමති ඔයත් එක්ක දවසක්ම ඉන්න. ඒත් ඒ වෙන දවසක.
ඒ දිනේ කවදාවත්ම එන්නේ නෑ නිර්මලි.
ඔයා කොහොමද දන්නේ?
මට හිතෙනවා. මට දැනෙනවා.
මම ඔයාට ආදරෙයි චතුර...
ඇති නිර්මලි අපි යං.
කොහාටද?
මාලිගාවට.
ඔව් චතුර ලබන ආත්මෙදිවත් එකතුවෙන්න අපි මළඟේ පූජා කරමු.
ඕක මේ ආත්මෙදි වෙන දෙයක් නෙමේනේ නිර්මලි?
එහෙනම්?
මේ ආත්මේ වෙන්න පුලුවන් දෙයක් ප්‍රාර්ථනා කරමු.
මොකක්ද?
මැරෙනකන්ම අපිව මුණ ගස්සවන්න එපා කියලා.....

හේමලාල් විද්‍යාරත්න,
දුම්රිය ස්ථානාධිපති.
මහනුවර,
ශ්‍රී ලංකාව.
lalvidya@yahoo.com